# වැවිලි හා ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය

# ඉන්දියානු රජය විසින් අරමුදල් සපයනලද වැවිලි නිවාස වැඩසටහන

ඉන්දියානු රජය විසින් ලයින් කාමරවල සහ තාවකාලික නිවහන්වල ජීවත්වන වැවිලි ප්‍රජාව සඳහා නිවාස 10,000 ක් ඉදිකිරීම සඳහා අරමුදල් සපයන ලදි. මෙම වැඩසටහන වැවිලි හා ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය යටතේ වැවිලි කලාප හතක (බදුල්ල, නුවරඑළිය, හැටන්, මහනුවර, රත්නපුර, කෑගල්ල සහ ගාල්ල) ක්‍රියාත්මක කෙරේ, ප්‍රජා යටිතලපහසුකම් අංශය විසින් ක්‍රියාත්මක වන මෙම වැඩසටහනේ කාල සීමාව වසර තුනකි. මෙම ව්‍යාපෘතිය සඳහා මූලිකව වසරක කාලයක් සඳහා කොන්ත්‍රාත්තු පදනම මත ව්‍යාපෘති ඉංජිනේරුවෙක් සහ ජ්‍යෙෂ්ඨ තාක්ෂණික නිලධාරීන් දෙදෙනෙකු බඳවා ගැනීමට අමාත්‍යාංශ, විසින් තීරණය කොට ඇත.

**01. ව්‍යාපෘති ඉංජිනේරු- තනතුරු 01 (PS 4 මට්ටම)**

පහත 1 හෝ 2 හි සඳහන් පරිදි අධ්‍යාපනික සුදුසුකම් සහ පළපුරුද්ද

01. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන අදාළ ක්ෂේත්‍රයේ ප්‍රථම උපාධියක් හෝ අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය ආයතනයක අන්තර් මධ්‍යම විභාගය සමත් වීම සමග අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 07 ක පශ්චාත් සුදුසුකම් පළපුරුද්දක් තිබීම
02. ශ්‍රී ලංකා ඉංජිනේරු සේවාවේ III/II හෝ ඉහළ පංතියක හෝ සමාන තත්ත්වයේ නිලධාරියෙකු වීම සමග III/II පංතියේ තනතුරක අවම වශයෙන් වසර 07ක පළපුරුද්දක් තිබීම

තනතුරු දෙක සඳහාම වැවිලි අංශ සංවර්ධන වැඩ හා විදේශීය අරමුදලින් ක්‍රියාත්මක වූ යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතියක පළපුරුද්ද ඇති අයවලුන්ට ප්‍රමුඛතාවය දක්වනු ලැබේ.

**සේවා ස්ථානය :** වැවිලි ප්‍රාදේශීය කාර්යාල/ අමාත්‍යාංශ කාර්යාලය

**02. ජ්‍යෙෂ්ඨ තාක්ෂණික නිලධාරී - තනතුරු 02 (PS- 5 මට්ටම)**

පහත 1 හෝ 2 හෝ 3 හි සඳහන් අධ්‍යාපනික සුදුසකම් හා පළපුරුද්ද

01. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන අදාළ ක්ෂේත්‍රයේ ප්‍රථම උපාධියක් හෝ තාක්ෂණික ක්ෂේත්‍රයට අදාළ තනතුරක් සඳහා තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන කාර්මික/ වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරනු ලබන ජාතික වෘත්තීය සුදුසුකම් (N.V.Q) මට්ටම 7ට නොඅඩු නිපුණතා සහතිකයක් ලබා තිබීම සමග අවශ්‍ය විශේෂතා අංශයේ අවම වශයෙන් වසර 04ක පළපුරුද්දක් තිබීම.
02. තාක්ෂණික ක්ෂේත්‍රයට අදාළ තනතුරක් සඳහා තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන කාර්මික/ වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරනු ලබන ජාතික වෘත්තීය සුදුසුකම් (N.V.Q) මට්ටම 6ට නොඅඩු නිපුණතා සහතිකයක් ලබා තිබීම සමග අවශ්‍ය විශේෂතා අංශයේ අවම වශයෙන් වසර 09ක පළපුරුද්දක් තිබීම.
03. තාක්ෂණික ක්ෂේත්‍රයට අදාළ තනතුරක් සඳහා තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන කාර්මික/ වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරනු ලබන ජාතික වෘත්තීය සුදුසුකම් (N.V.Q) මට්ටම 5ට නොඅඩු නිපුණතා සහතිකයක් ලබා තිබීම සමග අවශ්‍ය විශේෂතා අංශයේ අවම වශයෙන් වසර 14ක පළපුරුද්දක් තිබීම.

**සේවා ස්ථානය :** වැවිලි ප්‍රාදේශීය කාර්යාලවල/ අමාත්‍යාංශ කාර්යාලය

**පොදු කොන්දේසි :**

01. අයදුම්කරු වයස අවුරුදු 65ට අඩු අයෙකු විය යුතුය.
02. තෝරාගනු ලබන කාර්ය මණ්ඩල සාමාජිකයන් සඳහා වැටුප් කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2019 පරිදි ගෙවනු ලැබේ.
03. මූලික වැටුපට අමතරව ජීවන වියදම් දීමනාවද ගෙවනු ලැබේ.
04. රජයේ සේවක අර්ථ සාධක අරමුදල සඳහා සේවකයාගේ දායකත්වය මාසික වැටුපින් 8% ක් වන අතර, සේවා යෝජකගේ දායකත්වය 12%කි.
05. සේවා කොන්දේසි – මූලිකව, මෙම තනතුර වසරක කොන්ත්‍රාත් පදනම මත වේ. සතුටුදායක කාර්යක්ෂමතාවය සහ අමාත්‍යාංශයේ අවශ්‍යතාවය මත එය දීර්ඝ කිරීමට හැකිය.
06. රජයේ සේවකයන් දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් ස්වකීය අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය.

මේ සඳහා උනන්දුවක් දක්වන අයවලුන් ස්වකීය ජීව දත්ත, අධ්‍යාපනික හා පළපුරුද්ද පිළිබඳ සහතිකවල පිටපත් සමග 2025.05.31 වෙනි දින හෝ ඊට පෙර ලැබෙන පරිදි **"ලේකම්, වැවිලි හා ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය, ප්‍රජා යටිතළ පහසුකම් අංශය, අංක 45, ශාන්ත මයිකල් පාර, කොළඹ 03"**, යන ලිපිනයට ලියාපදිංචි තැපැල් මගින් එවීමට හැකිය. අයදුම්පත බහා එවන කවරයේ වම් පස ඉහළ කෙළවරේ අයදුම්කරන තනතුර සඳහන් කළ යුතුය.

**බී.කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති**
**ලේකම්,**
**වැවිලි හා ප්‍රජා යටිතළ සහසුකම් අමාත්‍යාංශය,**

**දුරකථන අංකය : 011-2541369**
**ෆැක්ස් : 011-2328117**
**ඊමේල් : secretary@mws.gov.lk**